ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්හි (“සමාගම”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහාය මා විසින් ලබා ගන්නා ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

කරුණක් අවධාරණය කිරීම

2011 අංක 3 දරන රක්ෂණ නියාමන පනතේ 53 වන වගන්තියට ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලද වෙන් කිරීමේ ක්‍රියාවලියේ තත්ත්වය සහ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත (සංශෝධන) පනතේ 30 වන වගන්තියට සම්බන්ධ පරිපාලන ක්‍රියාවලියේ තත්ත්වය විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවල 39 වන සටහන කෙරෙහි මම අවධානය යොමු කරමි. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කර නොමැත.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගම සහ සමූහය විසින් ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර

තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණ

1.5.1 අයෝග්‍ය තක්සේරු කිරීම හෝ ඇස්තමේන්තු කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් සැලකිය යුතු සංඛ්‍යාවක් මෙහෙයුම් කටයුතු සඳහා සක්‍රීයව භාවිත කරන බව ප්‍රධාන කාර්යාලයේ සහ තෝරාගත් ශාඛා කාර්යාලවල ස්ථාවර වත්කම් ලේඛන සමාලෝචනයේ දී අනාවරණය විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි - දේපල, පිරියත හා උපකරණ - 51 වගන්තියට පටහැනිව ආර්ථික ප්‍රතිලාභ අඛණ්ඩව ජනනය වුවද, ප්‍රයෝජනවත් ආයු කාලය නැවත තක්සේරු කිරීම හෝ එවැනි වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම හරහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු අනාගත ගැලපීමක් පිළිබිඹු වී නොමැත. වත්කම් කාණ්ඩය අනුව වර්ගීකරණය කරන ලද, ඇතැම් මූල්‍යමය වශයෙන් වැදගත් "සම්පූර්ණයෙන්ම ක්ෂය වූ නමුත් තවමත් භාවිතයේ පවතින" වත්කම් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත. වත්කම් පන්තිය — අයිතම ගණන — පිරිවැය වටිනාකම (රු.මිලියන) පරිගණක හා කාර්යාල උපකරණ — 3356 — 99.155 ගෘහ භාණ්ඩ හා සවිකිරීම් — 7401 — 42.256 අස්පෘශ්‍ය වත්කම් - මෘදුකාංග — 29 — 43.017	පරිගණක සහ කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් වැනි වත්කම් වෙන් කිරීමත් සමඟ, එකී වත්කම් අදාළ සමාගමට පවරා ඇත. සමාගමේ ප්‍රතිපත්තියට අනුව, ස්ථාවර වත්කම් සෑම වසර තුනකට (03) වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. තවද, 2025 වර්ෂය සඳහා, සමාගම විසින් ස්ථාවර වත්කම් සත්‍යාපනයක් සිදු කරනු ලබයි. සුදුසු සේවා සපයන්නෙකු සම්බන්ධ කර ගැනීම සඳහා ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සාර්ථකව අවසන් කර ඇති අතර, සත්‍යාපන ක්‍රියාවලිය සිදුකිරීම සඳහා තෝරාගත් පාර්ශවය සම්බන්ධ කරගෙන ඇත.	තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කළ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය කළමනාකරණය විසින් නැවත තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු අතර එම සමාලෝචන ක්‍රියාවලිය වරින් වර ක්‍රියාත්මක කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. රුපියල් මිලියන 110ක ලැබිය යුතු අයකරගත නොහැකි රඳවා ගැනීමේ බද්දක් (WHT) සමාගමේ දැනට ලැබිය යුතු අනෙකුත් මුදල්වලට ඇතුලත් කර ඇති බව නිරීක්ෂණය විය. අයකර ගැනීමේ හැකියාව තක්සේරු කිරීමට සහ අයකර ගත නොහැකි නම් අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කර කපා හැරීමට සමාගමේ කළමනාකාරිත්වය විසින් සුදුසු පියවර ගෙන නොමැත.	දිගු කාලීන හිඟ ශේෂය කපාහැරීමට වසර අවසානයේදී අවශ්‍ය පියවර ගනු ලැබේ.	අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතිය සහිතව අය කරගත නොහැකි රඳවා ගැනීමේ බද්දේ (WHT) ලැබිය යුතු ශේෂය සම්බන්ධයෙන් සමාගම විසින් සුදුසු පියවර ගත යුතුය. සහායක සාක්ෂි සහ කපාහැරීමට හේතු ද ඇතුලත් කරමින් කපාහැරීම සම්පූර්ණයෙන්ම ලේඛන ගත කළ යුතුය.
ආ. ලැබිය යුතු මුදල් ලෙජරය සමාලෝචනය කිරීමේදී, ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල ණය, නියෝජිත නිලධාරීන්ට ලබා දුන් යතුරු පැදි ණය සහ ලැබිය යුතු ලාභාංශ මුදල්වලට අදාළව රුපියල් මිලියන 22ක සෘණ ශේෂ නිරීක්ෂණය විය.	රුපියල් මිලියන 22න්, කාර්යමණ්ඩල ණය - රක්ෂණ සේවාව (රු.මිලියන 5.49) සහ ලැබිය යුතු ලාභාංශ රු. 2,432.07ක ශේෂයන් නිවැරදි කර ඇති අතර අනෙකුත් ශේෂයන් සැසඳුම් කරමින් පවතී.	සෘණ ශේෂයන්ගේ නීත්‍යානුකූලභාවය සත්‍යාපනය කිරීම සඳහා කළමනාකරණය විසින් ලැබිය මුදල් පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදුකිරීම සහ ඕනෑම නීත්‍යානුකූල නොවන ශේෂයක් කපාහැරීම හෝ සුදුසු ගිණුම්වලට නැවත වර්ගීකරණය කිරීම සිදු කළ යුතුය.

1.7 අදාළ පාර්ශව හා අදාළ පාර්ශව ගනුදෙනු අනාවරණය කර නොමැතිවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. පහත ලැයිස්තුගත කර ඇති සම්බන්ධිත පාර්ශවයන් සඳහා සමාගම විසින් දක්වන ලද අවසන් ශේෂයන් සහ එම පාර්ශවයන් විසින් ස්වාධීනව තහවුරු කරන ලද ශේෂයන් අතර විෂමතා නිරීක්ෂණය විය. ඊට අමතරව, ශේෂ තහවුරු කිරීම් හරහා හඳුනාගත් විචලනයන් විමර්ශනය කර විසඳාලීම සඳහා විධිමත් සැසඳුම් ක්‍රියාවලියක් සමාගම තුළ නොමැති බව නිරීක්ෂණය විය.	1. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශේෂයන් සැසඳීම සිදුකර ඇත. කාලානුරූප සැසඳුම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. 2. ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී සහ ලංකා හොස්පිටල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්) සමාගම අතර වෙනස ඇති වන්නේ ඉන්වොයිස් නිකුත්	පාලනය සහ වාර්තා කිරීමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කරනු වස් අදාළ පාර්ශව ශේෂයන් කලින් කලට සැසඳුම් කිරීමට, යම් විෂමතාවයක් වහාම විමර්ශනය කිරීමට, ගනු දෙනු නිවැරදිව වාර්තාකර කිරීමට අදාළ ලියකියවිලි මගින් සහාය දක්වන ව්‍යුහගත ක්‍රියාවලියක් සමාගම විසින් ස්ථාපිත කළ යුතුය.

විස්තරය	මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය (රු.මිලියන)	සනාථන අනුව ශේෂය (රු.මිලියන)	වෙනස (රු.මිලියන)
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්	1,059	1,068	(8)
ලංකා ඉන්ෂුවරන්ස්	241	238	2

කෝපරේෂන් ලියිෆ් ලිමිටඩ්				කිරීම සහ ගෙවීම් සැකසීම අතර කාල ප්‍රමාදය හේතුවෙනි.
ලංකා හොස්පිටල් කෝපරේෂන් පී.එල්.සී	6	8	(2)	
ලංකා හොස්පිටල් ඩයග්නොස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්	6	1	5	

ආ. රක්ෂණවාරික, හිමිකම් සහ අනෙකුත් වත්කම් සහ වගකීම් යටතේ ඇති ශේෂයන් සම්බන්ධිත අදාළ පාර්ශව ගනුදෙනු හඳුනාගැනීම සහ අධීක්ෂණය සඳහා සමාගමට පුළුල් හා විධිමත් යාන්ත්‍රණයක් නොමැති බව නිරීක්ෂණය විය. මෙම අඩුපාඩුව හේතුවෙන් අතපසුවීම් හෝ වැරදි වර්ගීකරණයන් පිළිබඳ අවදානම වැඩි කරන අතර, මූල්‍ය ප්‍රකාශනවල අසම්පූර්ණ හෝ සාවද්‍ය සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්වලට හේතු විය හැකිය.	සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර තුනකින් පැනනගී: වාරික හෝ හිමිකම් ගනුදෙනු, විකුණුම්කරු හෝ පාරිභෝගික ගෙවීම් සහ ආයෝජන ආශ්‍රිත ගනුදෙනු. ගනුදෙනුව ආරම්භයේදී මුදල් ගෙවීමේ පද්ධතියට (front-end system) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ස්වයංක්‍රීයව හඳුනාගැනීමේ හැකියාව දැනට නොමැත හෙයින්, මෙම ගනුදෙනු අතරින් වාරික සහ හිමිකම් ගනුදෙනු අතින් ගණනය කර (manually) හඳුනා ගනු ලැබේ. විකුණුම්කරු, පාරිභෝගිකයා සහ ආයෝජන ආශ්‍රිත ගනුදෙනු කළමනාකරණය කරනු ලබන්නේ SAP පද්ධතිය හරහා වන අතර, එහිදී එක් එක් සමාගමට වෙනම විකුණුම්කරු සහ පාරිභෝගික කේත ලබා දේ. තවද, ඇතුළත්වීමේ	නිවැරදි වාර්තාකරණය, විනිවිදබවින් යුත් හෙළිදරව් කිරීම් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම උදෙසා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනා ගැනීම, නියාමනය සහ වර්ගීකරණය සඳහා යාවත්කාලීන වාර්තා සහ ඒකාබද්ධ පාලනයන් මගින් සහාය දක්වන විධිමත් ක්‍රියාවලියක් කළමනාකරණය විසින් ස්ථාපිත කළ යුතු බව නිර්දේශ කෙරේ.

		ක්‍රියාවලියේදී අදාළ පාර්ශවයන් හඳුනා ගැනීම පහසු කිරීම සඳහා SAP පද්ධතිය තුළ කොඩි ක්‍රමයක් (tagging) පිළිබඳ යාන්ත්‍රණයක් සකස් කරමින් පවතී.	

1.8 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ D.5.2 වගන්තිය	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ D.5.2 වගන්තිය යටතේ, "මණ්ඩලය විසින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත, මණ්ඩලය විසින් පත් කරන ලද සභාපතිවරයෙකු සහිතව කාර්තුමය වශයෙන් රැස්වන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (RPT) සමාලෝචන කමිටුවක් ස්ථාපිත කළ යුතුය" වශයෙන් දකවා ඇත. කෙසේවෙතත්, සමාගමට සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කමිටුවක් නොමැති බව නිරීක්ෂණය විය.	සමාගම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (RPT) සමාලෝචන කමිටුව පිහිටුවීමේ කටයුත්තෙහි යෙදී සිටී.	සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කමිටුව පිහිටුවීමට නිර්දේශ කෙරේ.
ආ. රජය සතු ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 3.4 වගන්තිය	රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි සඳහන් මාර්ගෝපදේශයන්හි 3.4 වගන්තියේ දක්වා ඇති පරිදි, සෑම රාජ්‍ය ව්‍යාපාරයක්ම පුරප්පාඩු, නිර්මාණය කළ යුතු නව තනතුරු, අවශ්‍ය කුසලතා සහ අනුප්‍රාප්තික සැලැස්මක් ඇතුළුව එහි මානව සම්පත් අවශ්‍යතා හඳුනා ගෙන සැලසුම් කළ යුතුය. කෙසේවෙතත්, සමාගම විසින් අවශ්‍ය පරිදි අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.	නිර්දේශ කර ඇති පරිදි, සෑම අංශයක් සඳහාම අනුප්‍රාප්තික සැලැස්මේ කෙටුම්පත සකස් කිරීම අවසන් අදියරේ පවතින අතර 2026 වර්ෂය ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.	නායකත්වයේ අඛණ්ඩතාව සහතික කිරීම, මෙහෙයුම් අවදානම් අවම කිරීම, ආයතනික දැනුම ආරක්ෂා කිරීම, සේවක සංවර්ධනයට සහාය වීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා සමාගම විසින් විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවට නිර්දේශ කෙරේ.

ඇ. රජය සතු ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.4 වගන්තිය	රජය සතු ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.4 වගන්තිය යටතේ, අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් මගින් රජය සතු ව්‍යාපාරවල පාලනය, ක්‍රියාකාරිත්වය සහ තොරතුරු පද්ධතියට අදාළව ඇතිවිය හැකි අවදානම් මොනවාද යන්න ඇගයීමට ලක් කළ යුතු බවට අපේක්ෂා කෙරේ. අනුකූලතාව සහතික කිරීම, කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ අවදානම් සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා පද්ධති විගණන සිදු කිරීම ව්‍යාපාර සඳහා ඉතා වැදගත් වේ. විශේෂයෙන්, ස්වයංක්‍රීය යෙදුම් පිළිබඳ පද්ධති විගණනය සමාගම්වලට තම තොරතුරු තාක්ෂණ පද්ධති සහ ක්‍රියාවලීන් ආරක්ෂිත, විශ්වාසදායක සහ නියාමන අවශ්‍යතා සමඟ ගැලපි ඇති බව සහතික කිරීමට උපකාරී වනු ඇත. තොරතුරු තාක්ෂණ පද්ධති විගණන සඳහා අභ්‍යන්තර විගණන අංශය තුළ සුදුසුකම්ලත් පිරිස් නොමැති බව නිරීක්ෂණය විය. ස්වයංක්‍රීය අභ්‍යන්තර පාලන පරීක්ෂාවේ මෙම තීරණාත්මක කරණාවට විසඳුම් ලබා දීම සඳහා දක්ෂ මානව සම්පත් හෝ බාහිර සහාය අවශ්‍ය බවද නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලියිෆ් ලිමිටඩ් හි අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව, සුදුසුකම්ලත් පිරිස් සීමා සහිත වීම හේතුවෙන් පද්ධති විගණන පැවැත්වීමේ නොහැකියාව මෙහිදී පෙන්වා දෙනු ලැබේ. එපමණක් නොව, මෙය අස්ථිත්වය විසින් හඳුනාගෙන ඇති ඉහළම අවදානම් දහයෙන් එකක් ලෙස සැලකේ. කෙසේවෙතත්, විගණන දිනය දක්වා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	පද්ධති සහ තොරතුරු තාක්ෂණ විගණන සඳහා දැනුම නොමැතිකම පසුගිය වසර කිහිපය තුළම සාකච්ඡාවට ලක් වෙමින් පවතින ප්‍රධාන කරුණකි. කණ්ඩායමට සාමාජිකයෙකු බඳවා ගැනීමට බොහෝ උත්සාහයන් ගෙන ඇත. කෙසේවෙතත්, එම පුරප්පාඩුව තවමත් පුරවා නොමැත. පසුගිය විගණන කමිටු රැස්වීමේදී, මෙම ක්ෂේත්‍රය සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට උපදෙස් ලබා දුන් අතර, හැකි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පරතරය පිරවීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.	සුදුසුකම් ලත් පිරිස් ලබා ගැනීම තුළින් ප්‍රධාන අවදානම් විසඳා ගැනීමෙන් අනුකූලතාවය සහතික කර ස්වයංක්‍රීය අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමෙන් සමාගම තම අභ්‍යන්තර විගණන හැකියාව ශක්තිමත් කර ගත යුතු බවට නිර්දේශ කෙරේ.

ඇ. රජය සතු ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.3 වගන්තිය	රජය සතු ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.3 වගන්තිය යටතේ, "අවදානම් කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්විය යුතුය" වශයෙන් දක්වා ඇත. කෙසේවෙතත්, අවදානම් කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා ඇති බවත් අවදානම් කමිටුව කාර්තුමය වශයෙන් රැස් නොවන බවත් නිරීක්ෂණය විය.	2024 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) ලෙස සමාගම් දෙකකට වෙන් කරන ලදී. මෙම වෙන් කිරීමත් සමඟ, සමාගම්වල ක්‍රියාකාරිත්වය සාමාන්‍යකරණය කිරීමට සැලකිය යුතු කාලයක් ගතවිය. තවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාගම් දෙක සඳහා වෙන වෙනම මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BRMC) පිහිටුවීමට මෙම වෙන් කිරීම අවශ්‍යවිය. ඒ අනුව, SLICLL සහ SLICGL සඳහා BRMC විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ සාමාජිකත්වයෙන් පිහිටුවන ලදී. ඉහත කරුණු හේතුවෙන්, 2024 වර්ෂය සඳහා පමණක් මුල් මාස හය තුළ BRMC රැස්වීම් නොපැවැත්විය. අපගේ ERM ප්‍රතිපත්තියේ නියමයන්ට අනුකූලව BRMC රැස්වීම් පවත්වන අතර ඉදිරියට අදාළ සියලුම නීතිරීතිවලට අනුකූලව කටයුතු කරන බවට සහතික කරන්නෙමු.	අධීක්ෂණය, අවදානම් කළමනාකරණය සහ ආයතනික පාලන අවශ්‍යතා සඳහා අනුකූලත්වය ශක්තිමත් කිරීම සඳහා, මාර්ගෝපදේශයන්ට අනුකූලව, අවම වශයෙන් කාර්තුමය වශයෙන් සමාගම විසින් අවදානම් කමිටුව රැස් කළ යුතු බවට නිර්දේශ කෙරේ.

1.9 තොරතුරු තාක්ෂණ **පොදු පාලන**

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. තාර්කික ප්‍රවේශ පාලන ප්‍රතිපත්තිය-V2.0 හි 11.3.9 වගන්තියට අනුව, දින 90ක කාලයක් අක්‍රියව පවතින පරිශීලක ගිණුම් ස්වයංක්‍රීයව අක්‍රිය කිරීම තොරතුරු තාක්ෂණ අංශයේ වගකීම විය යුතුය. කෙසේවෙතත්, SAP පද්ධති පරිශීලක ලැයිස්තු සමාලෝචනය කිරීමෙන් දින 90ක කාලයක් භාවිත නොකළ ක්‍රියාකාරී පරිශීලක ගිණුම් පවතින බවත් අවසන් පිවිසුම් දිනයක් පිළිබඳ සටහනක් නොමැති එක් ක්‍රියාකාරී ගිණුමක් පවතින බවත් අනාවරණය විය.	නිර්දේශිත පරිදි, දින 90ක ගිණුම් අක්‍රියතා ප්‍රතිපත්තියට අනුකූලව අක්‍රිය පරිශීලක ගිණුම් හඳුනාගෙන අක්‍රිය කිරීම සඳහා SAP පද්ධතිය තුළ වරින් වර ප්‍රවේශ සමාලෝචන සිදු කර ඇත.	දින 90ක ප්‍රතිපත්ති අවශ්‍යතාවයට අනුකූලව, අක්‍රිය ගිණුම් අක්‍රීය කිරීම සඳහා සමාගම විසින් වරින් වර ප්‍රවේශ සමාලෝචන පැවැත්වීම නිර්දේශ කෙරේ.

ආ. SAP පද්ධතිය තුළ ක්‍රියාකාරී සාමාන්‍ය පරිශීලක ගිණුම් කිහිපයක් පවතින බව සමාලෝචනයෙන් හෙළිවිය. එවැනි ගිණුම් මගින් පුද්ගල වගවීම දුර්වල කරන අතර, පරිශීලක ක්‍රියාකාරකම් සොයා ගැනීම සහ වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීම දුෂ්කර කරයි. මෙය අනවසර ප්‍රවේශය, පද්ධති සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම සහ ආරක්ෂක ක්‍රියාමාර්ග කඩකිරීමට ඇති ඉඩකඩ පිළිබඳ අවදානම වැඩි කරයි. විස්තර පහත දැක්වේ.

පරිශීලක නාමය	ගිවිසුම් ප්‍රකාර පරිශීලක ස්වභාවය	අවසන් ප්‍රවේශ දිනය
BATCH		
AUDITTM P	SAP Application Limited Pro	1/28/2025
AUDITTM P1	SAP Application Limited Pro	2/15/2019
ADD	SAP Application Limited Pro	1/28/2025
BAD	SAP Application Limited Pro	1/28/2025
COBD	SAP Application Limited Pro	1/27/2025
AUDITTM P	SAP Application Limited Pro	1/28/2025
GENERAL D	SAP Application Limited Pro	1/27/2025
HRD	SAP Application Limited Pro	1/28/2025
IAUDIT	SAP Application Limited Pro	11/21/2024
ICTD	SAP Application Limited Pro	1/28/2025
LEGALD	SAP Application Limited Pro	1/28/2025
MKTD	SAP Application Limited Pro	1/28/2025
MKTD2	SAP Application Limited Pro	1/28/2025
NSAL	SAP Application Limited Pro	1/28/2025

ව්‍යාපාර මෙහෙයුම් සඳහා අවශ්‍ය නොවන සියලුම අත්‍යවශ්‍ය නොවන සාමාන්‍ය පරිශීලක ගිණුම් හඳුනාගෙන අක්‍රිය කිරීම සඳහා SAP පද්ධතිය තුළ පාලනයන් ක්‍රියාත්මක කර ඇත.

ව්‍යාපාර මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය නොවන සියලුම ක්‍රියාකාරී සාමාන්‍ය පරිශීලක ගිණුම් සමාගම විසින් වහාම සමාලෝචනය කර අක්‍රිය කළ යුතු බවට නිර්දේශ කෙරේ.

PAY_TMP2	SAP Application Limited Pro	1/28/2025
PRED1	SAP Application Limited Pro	1/28/2025
PRED2	SAP Application Limited Pro	1/28/2025
SECTD	SAP Application Limited Pro	1/28/2025
SUPPTRAI N	SAP Application Limited Pro	1/28/2025
DDIC	Test	10/19/2025
SAPOSS	Test	5/29/2024
SLI_ABAP	Test	5/29/2024
SLI_JKH	Test	1/27/2025
TRMAUDI T	Test	5/8/2023
UPLOAD	Test	10/2/2018

ඇ. SAP, B- රක්ෂණය, Claims1, AS400, HR පද්ධතිය සහ Workflow කළමනාකරණ පද්ධති ඇතුළු තීරණාත්මක පද්ධති සඳහා යෙදුම්, දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති ස්ථර හරහා වරප්‍රසාදිත පරිශීලක ගිණුම් අධීක්ෂණය ක්‍රියාත්මක කර නොමැති බව හඳුනා ගන්නා ලදී. වරප්‍රසාදිත ප්‍රවේශ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණයක් නොමැතිකම හේතුවෙන් මෙම අඩුපාඩුව මගින් සංවිධානය ඉහළ ආරක්ෂක සහ අනුකූලතා අවදානම්වලට භාජනය කරයි.

වරප්‍රසාදිත ප්‍රවේශ කළමනාකරණ (PAM) විසඳුමක් ක්‍රියාත්මක කිරීම දැනට සිදු වෙමින් පවතින අතර ප්‍රසම්පාදන අදියරේ පවතී. PAM විසඳුම මඟින් මෙහෙයුම් පද්ධති, දත්ත සමුදායන්, SAP සහ ක්‍රියාකාරී නාමාවලිය හරහා වරප්‍රසාදිත ක්‍රියාකාරකම් මධ්‍යගතව අධීක්ෂණය සහ පාලනය කිරීමේ හැකියාව ලබා දෙනු ඇත. 2026 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර අයවැය ගත කර ඇති අනන්‍යතා සහ ප්‍රවේශ කළමනාකරණ (IAM) විසඳුම හරහා යෙදුම් මට්ටමේ සුපිරි පරිශීලක අධීක්ෂණය ඒකාබද්ධ කෙරේ.

වර්තමානයේ, SAP පද්ධතිය තුළ තීරණාත්මක ගනුදෙනු මට්ටමේ අධීක්ෂණය ක්‍රියාත්මක කර ඇති අතර, මෙම සිදුවීම් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC) විසින් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ.

ව්‍යාපාරික අවශ්‍යතා සමඟ ගැලපෙන සුදුසු ප්‍රවේශ අයිතිවාසිකම් සහ නීත්‍යානුකූල ක්‍රියාකාරකම් සහතික කිරීම සඳහා කලින් කලට සිදු කරන සමාලෝචන ඇතුළුව, තීරණාත්මක පද්ධති හරහා වරප්‍රසාදිත පරිශීලක ක්‍රියාකාරකම් සඳහා සංවිධානය විසින් ශක්තිමත්, අඛණ්ඩ අධීක්ෂණ රාමුවක් ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කෙරේ.

ඇ. වෙනස්කම් කළමනාකරණ ක්‍රියාපටිපාටිය V 2.0 හි 4.1.1 වගන්තියට අනුව, වෙනස් කිරීම පිළිබඳ සියලුම ඉල්ලීම්, අනුමත කළත් ප්‍රතික්ෂේප කළත්, ප්‍රමිතිගත සහ මධ්‍යගත පද්ධතියක සටහන් කළ යුතුය. සියලුම වෙනස් කිරීමේ ඉල්ලීම් අනුමත කිරීම සහ ඒවායේ ප්‍රතිඵල ලේඛන ගත කළ යුතුය. කෙසේවෙතත්, වෙනස් කිරීමේ ඉල්ලීම් පිළිබඳ විස්තර සටහන් කිරීම සඳහා සමාගමට මධ්‍යගත පද්ධතියක් නොමැති බවත්, අනුමත හෝ ප්‍රතික්ෂේපිත වෙනස්කම් පිළිබඳ ලැයිස්තුවක් සමාගම තුළ පවත්වාගෙන නොයන බවත් නිරීක්ෂණය විය.

නිරීක්ෂණයෙන් පෙන්වා දුන් කරුණට විසඳුම් සෙවීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, Manage Engine Service Desk Plus - ICT Helpdesk Solution ක්‍රියාත්මක කිරීමත් සමඟ, දැනට පවතින අතින් වෙනස් කිරීමේ කළමනාකරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීය බවට පත් කර ඇත. අනුමත ක්‍රියාපටිපාටියට අනුකූල වෙමින්, නව පද්ධතිය මඟින් අනුමත තත්ත්වය පිළිබඳ නිසි ලේකන සටහන් තබා ගනිමින් සියලුම වෙනස් කිරීමේ ඉල්ලීම් සම්බන්ධයෙන් මධ්‍යගත ප්‍රවේශවීම (logging), අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පහසුකම් සපයයි.

වර්තමානය වන විට අවශ්‍ය සියලුම පද්ධති වින්‍යාස කිරීම් සහ පරීක්ෂණ අවසන් කර ඇති අතර, ස්වයංක්‍රීය ක්‍රියාවලිය 2025 නොවැම්බර් සිට භාවිතයට ගනු ලැබේ.

ස්ථිරබව සහ අනුකූලතාව සහතික කිරීම සඳහා අනුමත V2.0 වෙනස් කිරීමේ කළමනාකරණ ක්‍රියාපටිපාටිය සමඟ ගැළපෙන පුළුල් වෙනස් කිරීමේ කළමනාකරණ රාමුවක් සමාගම විසින් ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කෙරේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2,642 ක ලාභයක් ලබා තිබූ අතර ඉකුත් වර්ෂයේ අනුරූපී ලාභය රු.මිලියන 0.59 ක් විය.එබැවින්,මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 2641 ක වර්ධනයක් නිරීක්ෂණය විය.වර්ධනය සඳහා හේතුව වූයේ ජීවිත රක්ෂණ ව්‍යාපාරය කණ්ඩායම් වලට බෙදීම නිසා දළ ලිඛිත වාරිකය රු. මිලියන 24,530 කින් වැඩිවීම වේ.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන අදායම් හා වියදම් අයිතමයන් අයවැයගත ප්‍රමාණ හා සැසඳීමේ විශ්ලේෂණය සහ ගණනය කරන ලද විචලනයන් පහත දැක්වේ.

	අයවැය	සත්‍ය	විචලනය	වැඩිවීම/අඩු වීම
	රු. **000**	රු. **000**	රු. **000**	
ආදායම	**41,777,436**	**49,729,533**	**7,952,097**	**19%**
දළ ලිඛිත වාරිකය	**22,940,976**	**24,530,862**	**1,589,886**	**7%**
ශුද්ධ ඉපයීම් වාරිකය	**22,230,431**	**23,568,520**	**1,338,089**	**6%**
ආයෝජන අදායම	18,954,829	25,770,499	**6,815,670**	36%
ගාස්තු සහ කොමිස් අදායම	57,255	75,727	**18,472**	32%
වෙනත් ආදායම්	534,921	314,787	**(220,134)**	-18%
මුළු වෙනත් ආදායම	**41,777,436**	**26,161,013**	**(15,616,423)**	**-37%**
ශුද්ධ ප්‍රතිලාභ සහ ගෙවූ හිමිකම්	**(12,305,976)**	**(12,016,597)**	**(289,379)**	**-2%**
ප්‍රාරක්ෂණය සහ ශුද්ධ අත්පත්කර ගැනීමේ පිරිවැය	(3,037,415)	(3,260,446)	**223,031**	7.3%
වෙනත් මෙහෙයුම් සහ කළමනාකරණ වියදම්	(6,502,509)	(5,501,145)	**(1,001,364)**	-15%
ආදායම් බදු වියදම	**1,993,154**	**(1,734,756)**	**(3,727,910)**	**-187%**
වර්ෂයේ ශුද්ධ ලාභය	**17,938,382**	**2,641,848**	**(15,296,534)**	**-85%**

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සමාගමේ ප්‍රධාන අනුපාතයන් පහත වගුවේ දක්වා ඇත.

සමාගමේ විශේෂිත අනුපාතයන්	**2024**
රැදවුම් අනුපාතය	96%
හිමිකම් අනුපාතය	51%
වියදම් අනුපාතය	37%
ඒකාබද්ධ අනුපාතය	88%
ලභාදයිත්ව අනුපාතය	5%
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය	2%
හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය	17%
ආයෝජන ප්‍රතිලාභ අනුපාතය	12%
මුළු වත්කම් මත මූල්‍ය වත්කම් අනුපාතය	97%

වත්කම් පිරිවැටුම් අනුපාතය	0.21
ශුද්ධ ලාභ අනුපාතය	11%
ජංගම අනුපාතය	3.3
කොටසක ඉපයීම	2.3
කොටසක ශුද්ධ වත්කම් අනුපාතය	12.22
වෙළඳපොල කොටස	**13%**

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් අලාභ

විගණන නිරීක්ෂණය

ස්ථාපිත මෙහෙයුම් මාර්ගෝපදේශ අනුව පෙර දිනයේ සියළු මුදල් එකතු කිරීම් පසු දින උදේ 10.00 ට පෙර තැන්පත් කල යුතුය.මහරගම ශාඛාවේ 2023 ජුනි 01 සිට ජුනි 26 දක්වා කාලසීමාව තුළ එකතු කරන ලද රුපියල් 5,199,233 මුදලක් (රු.229,900 ක් ජීවිත රක්ෂණ වලින් සහ සාමාන්‍ය රක්ෂණ වලින් රු.4,970,223 ක් ඇතුළත්ව) ඉහත මාර්ගෝපදේශ අනුව තැන්පත් කර නොතිබූ අතර වංචාවක් සිදුව ඇත.සම්පූර්ණ විමර්ශනයක් සිදු කළ ඇති අතර විනය පරීක්ෂණ මණ්ඩලය දෝෂය සම්බන්ධයෙන් අයකැමි සහ ශාඛා කළමනාකරු වග කිය යුතු බව තීරණය කළේය. අලාභය අයකැමිගෙන් අයකර ගත යුතු බව මණ්ඩලය නිර්දේශ කල අතර සුදුසු නීතිමය කටයුතු ආරම්භ කරන ලදී. කෙසේනමුත්,අලාභය අය කර ගැනීමේ ක්‍රියාවලියේ තත්ත්වය පිළිබඳව තොරතුරු හෝ උපකාරක ලිපිලේඛන විගණනය වෙත ලබා දී නොමැත.

කළමනාකරණ අදහස් දැක්වීම්

නිර්දේශ කර ඇති පරිදී,මුදල් පරිහරණය,තැන්පත් කිරීම සහ සැසදීම් ක්‍රියාවලින් ශක්ත්මත් කිරීමට සමහර ප්‍රධාන ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.

1. **තැන්පත් පත්‍රිකා ක්‍රියාවලිය**: ප්‍රධාන කාර්යාලයට ඔවුන්ව මාර්ගගතව සම්බන්ධ කර ගැනීමට ඉඩ සලසා දෙමින් සහ දෘඩ පිටපත් ඉදිරිපත් කිරීම නවතා දමමින් ශාඛා වර්තමානයේ මුදල්, චෙක්පත් සහ බැර කාඩ් තැන්පත් පත්‍රිකා සෘජුවම B-ජීවිත පද්ධතියට උඩුගත කරයි.

2.**බැංකු ගිණුම් ආකෘතිය** :
විවිධ ශාඛා ගිණුම් වෙනුවට පොදු තනි ජංගම ගිණුමක් ඇති කරන ලදී.පහසුවෙන් සොයා ගැනීම සහ සැසදීම් සඳහා බැංකු ප්‍රකාශන වල SLICLL සහ ශාඛා යොමුවන් ඇතුළත් වේ.

3.**සැසදීම් ක්‍රියාවලිය :**

නිරවද්‍යතාවය සහ කාලීනව බව වැඩි දියුණු කරමින් වර්තමානයේ මුදල් සහ චෙක්පත් සැසදීම් වැඩ කරන දින වලදී සම්පූර්ණ කෙරේ.

4.**අධීක්ෂණ පාලනයන් :**

ශාඛා කළමනාකරුවන් අයකැමි ක්‍රියාවලින් අධීක්ෂණය කළ යුතුය.මූල්‍ය දෙපාර්තමේන්තුව අධිකාරීත්වය සොයා බැලිය යුතු අතර පද්ධතිය හරහා තැන්පත් උඩුගත කර සිදු වෙමින් තිබෙන

නිර්දේශය

සියළු ශාඛාවල මුදල් පරිහරණය සහ තැන්පත් ක්‍රියාපරිපාටින් අනුගමනය කිරීම ශක්තිමත් කිරීම, නැවත සිදුවීම වළක්වාලීමට අධීක්ෂණ පාලනයන් වැඩිදියුණු කිරීම,යම් අනාගත කඩවීම් වලදී කාලීන වගවීම සහතික කිරීම කළමනාකරණය කළ යුතු බවට නිර්දේශ කෙරේ.

අයිතම සඳහා දිනපතා සිහිකැඳවීම් යැවිය යුතුය.

5.ඊළඟ පියවර - පද්ධති ස්වංක්‍රීයකරණය

වවුචර් හෝ තැන්පත් පත්‍රිකා නිසි වේලාවට සැකසීම් නොවන විට ලදුපත් නැවත්වීමට ස්වංක්‍රීය ඇහිරීමේ ක්‍රමයක් වැඩි දියුණු කරමින් පවතී.බැංකු දත්ත සමග වලංගුතාවය සම්පූර්ණ වූ විට මුදල් සහ චෙක්පත් ගොනු උඩුගතකිරීම් සම්පූර්ණනයෙන්ම ස්වංක්‍රීය වේ.

පැමිණිල්ල සම්බන්ධයෙන් වන විට, එය තවමත් පරීක්ෂා කරමින් පවතින අතර අවශ්‍ය සියළු ලිපි පොලිසිය වෙත ලබා දී ඇත.වර්තමාන ප්‍රගතිය පිළිබඳ දන්වන ලෙස ඉල්ලා සිටියත් තවම ප්‍රතිචාරයක් නොලැබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතාවයන්

විගණන නිරීක්ෂණය	කළමනාකරණ අදහස් දැක්වීම්	නිර්දේශය
අ.වෙන්කිරීමේ ක්‍රියාවලිය සඳහා කළමනාකරණය විසින් ස්ථාපිත කරන ලද සකස් කිරීමේ ක්‍රියාපටිපාටිය අනුව, මෙහෙයුම් අවශ්‍යතාවයන් පදනම් කර ගෙන මෝටර් වාහන සමාගම සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) අතර බෙදා දිය යුතුව ඇත.කෙසේනමුත්, නවතම ස්ථාවර වත්කම් ලේඛණය (FAR) පිළිබඳ සමාලෝචනය මගින් මෙම වාහන තවමත් සමාගමට පවරා නොමැති බව දක්වයි.මෙම මෝටර් වාහන වල මුළු ලියා හල වටිනාකම රු.මිලියන 252 කි. මණ්ඩලය සමාගමට අදාළ මාර්ගෝපදේශයන් නිකුත් කර තිබූ බවත් පැවරීම සම්බන්ධයෙන් මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) සමඟ සාකච්ඡා පවත්වා ඇති බව නිරීක්ෂණය කරන ලදී.මීට අමතරව, වෙන්කිරීම් වලින් පැනනැගුණු පරිපාලන නම වෙනස් කිරීම ඇතුළත්ව ඇතැම් පරිපාලනමය කරුණු සිදු කරමින් පවතින නිසා සමාගම දිගුවක් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. සමාගම දැනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) වෙතින් ලිඛිත ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටී. ඒ අනුව, දැනට සිදු කරමින් පවතින මෙහෙයුම් සහ පරිපාලනමය කරුණු හේතුවෙන් 2002 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත (සංශෝධන) පනතේ 30 වන වගන්තිය යටතේ පරිපාලනමය පරිපාටින් වල ඇතිවිය හැකි අනුගත නොවීමේ තත්ත්වයක් නිරීක්ෂණය කරන ලදී.	සමාගම සමාගමට සහ සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) ආයතනයට වාහන වල හිමිකාරිත්වය පැවරීමේ කටයුතු වල නිරත වේ. 2025 සැප්තැම්බර් 30 දිනට යාවත්කාලීන කළ තත්ත්වය මුළු රථ වාහන සංඛ්‍යාව – 41 2025 සැප්තැම්බර් 30 දිනට සම්පූර්ණ කළ – 25 සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය – 61% අදාළ ව්‍යවස්ථාපිත මණ්ඩල යන්ගේ (මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව) අවශ්‍ය අනුමැතිය/කැමැත්තට යටත්ව ඉතිරි වාහන වල පැවරීමේ කටයුතු සිදු කරමින් පවතී.	වෙන්කිරීමේ සැලසුම අනුව,මෝටර් වාහන වල හිමිකාරිත්වය ඉතා ඉක්මනින් සමාගමට පැවරීමට කළමණාකරණය වග බලා ගන්නා බවට නිර්දේශ කෙරේ.මූල්‍ය වාර්තා නිවැරදිව යාවත්කාලීන කල යුතු අතර සැකසුම් පරිපාටිය සමගාමීව සියළු වත්කම් පැවරීම් සම්පූර්ණ කර ඇති බවට තහවුරු කිරීමට අභ්‍යන්තර සමාලෝචනයක් සිදු කල යුතුය.
ආ.වර්තමානයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ තනි ප්‍රතිරක්ෂකයා වීමත් සමඟ ප්‍රතිරක්ෂණ සැලසුම් පවත්වා ගන්නා බවට නිරීක්ෂණය කළේය.එකම ප්‍රතිරක්ෂකයා මත විශ්වාසය තබමින් සමාගම අවදානම එක්රැස් කිරීම, සම්මුති තෝලනය සීමා කිරීම සහ ප්‍රතිරක්ෂකයාගේ මූල්‍ය හෝ මෙහෙයුම් අභියෝග වලදී විය හැකි අවදානම වැඩිවීමට සමාගම නිරාවරණය කරයි.	ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) වෙනත් ප්‍රතිරක්ෂකයකු හඳුන්වා දීමේ ක්‍රියාවලියේ නිරතවන අතර සාකච්ඡා සිදු කරමින් පවතී.	කළමනාකරණය දැනට පවතින ප්‍රතිරක්ෂණ ක්‍රමෝපායේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සහ ආශ්‍රිත අවදානම් අවම කිරීමට ප්‍රතිරක්ෂක සම්බන්ධතා විවිධාන්ගීකරණය සලකා බැලීම සහ සමස්ථ අවදානම් කළමනාකරණ පරිවයන් ශක්තිමත් කිරීම කළ යුතු බවට නිර්දේශ කෙරේ.

ඇ. දෙහිවල,රත්නපුර,පානදුර,කළුතර සහ නුගේගොඩ ශාඛාවල ස්ථාවර වත්කම් ලේඛණ (FAR) පවත්වා නොතිබූ බවට නිරීක්ෂණය කරන ලදී. තවද, අස්ථිත්වයන් දෙක අතර මනාව වත්කම් වෙන් කිරීමට හේතු නොවූ වෙන්වූ ස්ථාවර වත්කම් ලේඛණ සමාගම සහ සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) සඳහා ගම්පහ සහ මහනුවර ප්‍රධාන ශාඛාවන් තුළ පවත්වා නොගනියි. වත්තල සහ බම්බලපිටිය ශාඛාවල, දෙපාර්තමේන්තු අතර සමහර වත්කම් වත්කම් සොයාගැනීම් සංකීර්ණ කරමින් බෙදනු ලබයි.

වත්තල ශාඛාවේ වත්කම් ප්‍රමාණවත් ලෙස සෙවීම් කිරීම හෝ කේත කිරීම කර නොමැති අතර සවිස්තරාත්මක වත්කම් ලැයිස්තු සමඟ උපකාරක ලිපිලේඛන පවත්වා නොගනියි.අතිරේකව, තවදුරටත් ක්‍රියාත්මක නොවන හෝ සීමිත ආර්ථික වටිනාකමක් සහිත සුන්බුන් වත්කම් මූල්‍ය වාර්තා වල වාර්තා වී තිබෙන අතර සමාගම සතුව අදායම් ජනනය කිරීමට උපයෝජනය නොකළ නිෂ්කාර්ය වත්කම් වේ.

වත්කම් වෙන් කිරීමේ ක්‍රමවේදය සහ ක්‍රියාවලිය එකඟ වී අනුමත කර ඇත. කෙසේනමුත්,සුදුසු පාර්ශවයක් පත් කිරීම අවශ්‍ය වන භෞතික ක්‍රියාත්මක කිරීමක් සිදු කර නොතිබිණි. (වත්කම් කේතයන් අදාළ කිරීම) දැන් එය පැවැත්වීමට සුදුසු පාර්ශවයක් තෝරා ගෙන ප්‍රදානය කර (BDO පාර්ශවකරුවන්) ඇත.

මීට අතිරේකව, යම් සුන්බුන් අයිතම් තිබේ නම් හෝ එම අයිතම ප්‍රධාන කාර්යාලයට ආපසු යවා ඇත්නම්, අදාළ ආකෘති නිසි පරිදී සම්පූර්ණ කර විධිමත් දැනුම්දීමක් සමඟ මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු බව සියළු ශාඛාවන්ට දැනුම් දී ඇත.

සමාගම සඳහා වෙනම යාවත්කාලින ස්ථාවර වත්කම් ලේඛණයන් පවත්වා ගැනීම, ව්‍යුහාත්මක වත්කම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම,සුන්බුන් වත්කම් කපා හැරීම හෝ ගැලපීම සහ මෙහෙයුම් ප්‍රශස්ථ කිරීමට නැවත වෙන් කිරීම සඳහා නිෂ්කාර්ය වත්කම් තක්සේරු කිරීම කළමනාකරණය සිදු කල යුතු බව නිර්දේශ කෙරේ.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාවයන්

විගණන නිරීක්ෂණය	කළමනාකරණ අදහස් දැක්වීම්	නිර්දේශය
අ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත යවන ලද "රක්ෂණ සමාගම් වල අවදානම් තක්සේරුව සම්බන්ධ වාර්තාව" අනුව,2024 වර්ෂය සඳහා රෝහල්ගත වීම් හිමිකම් යටතේ රු.2,006,700 ක වංචාකාරී හිමිකම් ගෙවීම් අවස්ථා 24 ක් සහ 2023 වර්ෂය සඳහා රෝහල්ගත වීම් හිමිකම් යටතේ රු.1,344,600 ක වංචාකාරී ගෙවීම් අවස්ථා 30 ක් නිරීක්ෂණය කරන ලදී. එවැනි වංචාකාරී හිමිකම් සිදුවීම මඟින් ස්වාධීන සමාලෝචනය ඇතුලත්ව රක්ෂණ හිමිකම් ගෙවීම් ක්‍රියාවලිය මත අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමේ වැදගත්කම පෙන්නුම් කරනු ලබයි.	ස්ථාපිත හිමිකම් ක්‍රියාපරිපාටිය අනුව, හිමිකම් ඇස්තමේන්තු සහ හිමිකම් අනුමැතිය යන ක්‍රියාවලින් අතර පැහැදිළි රාජකාරී බෙදීමක් ඇත.මෙම පාලනය නොසලකා, විශේෂයෙන්ම සෞඛ්‍ය හිමිකම් ඉල්ලීම් වලට අදාලව සේවාදායකයින් වංචාකාරී හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ නිසග අවදානමක් තිබේ.මෙම අවදානම අවම කිරීමට, පහත දැක්වෙන අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කර ඇත. 1. **හිමිකම් අනුමත සීමා:**නිර්වචනය කරන ලද අධිකාරී සීමාවන් හිමිකම් කාර්යමණ්ඩලයට ඔවුන්ගේ කාර්යය සහ ශ්‍රේණිය පදනම්ව පවරා දී ඇත. 2. **ද්විත්ව පාලන යාන්ත්‍රණය** : ස්වාධීන සමාලෝචනය සහ අධිකාරිත්වය තහවුරු කිරීමට හිමකම් සඳහා ද්විත්ව අනුමැතියක් අවශ්‍ය කෙරේ. 3. **හිමිකම් පරීක්ෂා කිරීම** : සිදු විය හැකි වංචා හෝ අක්‍රමිකතාවයන් පෙන්නුම් කරන අවස්ථාවලදී විශේෂ පරීක්ෂා සිදු කරයි. 4. **පූර්ව සත්‍යාපන ක්‍රියාවලිය :** ඉදිරිපත් කරන ලද තොරතුරු සහ ලිපිලේඛන වල වලංගුතාවය තහවුරු කිරීමට හිමිකම් පූර්ව සත්‍යාපනයකට යටත් වේ. 5. **අභ්‍යනතර විගණනය මගින් පසු විගණනය:** අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අනුකූලතාවය තක්සේරු කිරීමට සහ විය හැකි විෂමතාවයන් හඳුනා ගැනීමට පසු හිමිකම් විගණන සිදු කරනු ලබයි. 6. **අඛණ්ඩ අධීක්ෂණය :** අස්වාභාවික ක්‍රමයන් හෝ සැකසහිත කටයුතු හඳුනා ගැනීමට හිමිකම් මත අඛණ්ඩව අධීක්ෂණය කෙරේ. 7. **පද්ධති පාදක පාලනයන් :** ස්වයාක්‍රීය පද්ධති පාලනයන් අධිකාරී බලය නොලත් හිමිකම් ක්‍රියාවලීන් වළක්වාලීමට සහ නිරවද්‍යතාවය වැඩි කිරීමට ක්‍රියාත්මක වෙමින් තිබේ.	වංචාකාරී හිමිකම් අවදානම අවම කිරීමට රක්ෂණ හිමිකම් ගෙවීම් ක්‍රියාවලිය මත අභ්‍යන්තර පාලනයන් සමාගම ශක්තිමත් කල යුතු බවට නිර්දේශ කෙරේ.ඉහළ අවදානම් හිමිකම් සඳහා දියුණු සත්‍යාපන ක්‍රියාපරිපටීන් ක්‍රියාත්මක කිරීම,රාජකාරී බෙදීම සහ ස්වාධීන සමාලෝචන යාන්ත්‍රණයක් ඇති කිරීම මෙයට ඇතුලත් කළ යුතු අතර සැකකටයුතු හිමිකම් සඳහා කාලීනව හඳුනා ගෙන වංචා වැලක්වීමට කටයුතු කළ යුතුය.
ආ. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) අලෙවිකරණ කාර්යය සමාලෝචනය මගින් වෙළඳපොල පර්යේෂණ,සේවාදායක සම්බන්ධතා කළමනාකරණය සහ මාධ්‍ය සම්මන්ත්‍රණ වැනි	පහත දක්වා ඇති සැසඳීම මෙම විචලනයට විස්තරාත්මක පැහැදිළි කිරීමක් ලබා දෙන අතර ඒ අනුව, 2024 වර්ෂය සඳහා ඌනඋපයෝජිත අලෙවිකරණ අයවැය රු. 7,153,502.92 දක්වා එනම් සියයට 1.7 කින් අඩු වේ.	සමාගම තම අලෙවිකරණ අයවැය සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීම,ප්‍රධාන කටයුතු වලට ප්‍රමුඛත්වය දීම,ඵලදායීව ක්‍රමෝපාය ඉලක්ක ක්‍රියාත්මක කිරීම සහ අලෙවිකරණ කාර්යසාධනය වැඩි කිරීම

වැදගත් කටයුතු සඳහා අරමුදල් වෙන් නොකිරීම ඇතුළත්ව වෙන් කරන ලද අරමුදල් වලින් රු.මිලියන 120 ක් (22%) වියදම් නොකර තිබීමත් සමග 2024 වර්ෂයේ අලෙවිකරණ අයවැයේ කැපීපෙනෙන ඌනඋපයෝජනයක් අනාවරණය කරන ලදී. පෙන්වා දී ඇති පරිදී,සංස්ථා මාර්ග වලින් නව ව්‍යාපාර වල සියයට 16 ක් අඩුවීම, අලෙවිකරණ විධායක මගින් ව්‍යාපාර වල සියයට 50 ක පහත වැටීමක් සහ සංස්ථා ඉලක්කයට අනුව 12,765 ඔප්පු වල සමස්ථ අඩුවීම ලෙස මෙම උපයෝජනයේ අඩුවීම ඉතාමත් අහිතකර ලෙස ව්‍යාපාර කාර්යසාධනය කෙරෙහි බලපෑවේය.විදේශ ගත වන පුද්ගලයන් නව නිෂ්පාදන වැඩිදියුණු කිරීම, අන්තර්ජාතික බෙදාහැරීම් මාර්ග ව්‍යාප්ත කිරීම,ඩිජිටල් වේදිකාවන් හරහා සේවාදායක අත්දැකීම් වැඩි කිරීම ඇතුළත්ව සංයුක්ත සැලස්මේ දක්වා තිබෙන ක්‍රමෝපාය අරමුණු 2024 වර්ෂයේදී ඵලදායීව ක්‍රියාත්මක කර නොතිබුණි.තවද, අලෙවිකරණ අංශය විධායක මට්ටමේ පුරප්පාඩු පහක් ඇතුළත්ව කාර්යමණ්ඩල පුරප්පාඩු 15 ක් සහිතව 2024 ප්‍රතිවිහුහගත කිරීමෙන් පසු විධිමත් අනුමත කාර්යමණ්ඩලයක් නොමැතිව අඛණ්ඩව කටයුතු කළේය.එමනිසා, ඵලදායි අලෙවිකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමට එහි ධාරිතාවය සීමා විය. මෙම අඩුපාඩු සියල්ල සලකා බැලූ විට ක්‍රමෝපාය සැලසුම් කිරීම සම්පත් උපයෝජනය,අනුකූලවීම සහ සංවිධාන ආකෘතියේ දුර්වලතාවයන් දක්වමින් සමාගමේ තරඟකාරීත්වය,වර්ධනය සහ දිගුකාලීන තිරසාරත්වය පහත දමනු ලබයි.

විස්තරය	රු.
SAP අනුව අයවැය ශේෂය (ජන - දෙසැ 2024)	533,736,659.88
(-) අයවැය ජනවාරි 2024 වෙන් කිරීම් දිනය වන 2024 පෙබරවාරි 01 ට පෙර	19,663,503.63
2024 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා වෙන්කිරීමෙන් පසු මාස 11 සඳහා අයවැය	514,073,156.25
2024 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා අනුමත අයවැය	401,212,500.00
වෙනස	112,860,656.25
නියෝජිතයන්ගෙන් පසුව අය කරන අනුපූරක අයිතම සඳහා තාවකාලික වැඩිදියුණු කිරීම	35,246,710.00
අනුපූරක අයිතම සඳහා විකිණුම් සහාය අයවැය මගින් අයවැය මාරු කිරීම්	2,143,260.00
SAP පද්ධතියේ අදාළ පිරිවැය මුලිකාංග වල අයවැය සැලසුම් අතර අවශ්‍ය හුවමාරුවීම් නොකර අභ්‍යන්තර නියෝග අතර අයවැය මාරු කිරීම් සිදු කර ඇත.	75,470,686.25

අලෙවිකරණ අයවැය උපයෝජනය 2024

විස්තරය	රු.
2024 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා අනුමත අයවැය	401,212,500.00
2024 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා සත්‍ය වියදම්	394,058,997.08
2024 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා උපයෝජනය නොකළ අලෙවිකරණ අයවැය	7,153,502.92

සහ තිරසාර වර්ධනය සහාය වීම සඳහා කාර්යමණ්ඩල අඩුව පිරවීම සිදු කළ යුතු බවට නිර්දේශ කෙරේ.

ඇ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL), නිකුත් කරන ලද ක්‍රියාපරිපාටින් අනුව, සියළු රක්ෂකයන් සහ තැරව්කරුවන් පැමිණිලි අනිසි ප්‍රමාදයකින් තොරව විසඳීමට වග බලා ගනිමින් පැමිණිල්ලක් ලද දින සිට උපරිම මාස තුනක් ඇතුලත රක්ෂණ නියෝජිතයන්ට අදාළ විමසීම් අවසාන කිරීම අවශ්‍ය වේ. කෙසේනමුත්, 2024 වර්ෂයේදී ලද සමහර පැමිණිලි නියමිත කාලරාමුව අවසන් වුවත් විසඳා නොමැතිව පවතින බව පැමිණිලි කළමනාකරණ පද්ධතිය සමාලෝචනය මගින් අනාවරණය කළේය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් නියම කරන ලද ක්‍රියාපරිපාටියට අනුකූල නොවීම සහ පැමිණිලි විසඳීම ප්‍රමාද වීමෙන් විභව කීර්තිනාම අවදානමක් නිර්මාණය කිරීම මෙයින් පෙන්නුම් කරයි.

පැමිණිලි අංකය / ID	ලද දිනය
210224199	2024/11/07
210224087	2024/09/10
201224051	2024/08/14
210223970	2024/07/02
210223941	2024/06/20
210223701	2024/03/20

පැමිණිලි කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.කෙසේවෙතත්,සමහර සීමාවන් නිසා,විමසුමේ නිරීක්ෂණය කර ඇති පරිදි නියමිත කාල රාමුව ඉක්මවිය හැකිය.ඒවා,විසඳීමෙන් පැවතීමට හේතු පහත වේ.

පැමිණිලි අංකය	ප්‍රතිචාරය
20224199	විසඳුම පිලිබඳව අපි දැනටමත් රක්ෂිතයාට දන්වා ඇති අතර එය CMS හි යාවත්කාලීන කර නොමැත.
210224087	මුලින්ම,අප පරීක්ෂණයක් පැවැත් වූ අතර නියෝජිතයා ඉවත් කරන ලදී. නියෝජිතයා ඉදිරිපත් කරන ලද අභියාචනය පදනම්ව විමර්ශන අංශය මගින් පැමිණිලි නැවත පරීක්ෂා කෙරේ.
201224051	අංක 201224051 දරන වෙන්වූ පැමිණිල්ලක් නොමැත.අංක 210224051 දරන විභාග වෙමින් පවතින පැමිණිල්ලක් ඇත.මෙම කරුණ පළමු පැමිණිල්ලේ සොයා ගැනීම් මත නැවත විමර්ශනය කරන අතර එය නියෝජිත පැමිණිලි මණ්ඩලයට ඔවුන්ගේ තීරණ සඳහා ඉදිරිපත් කෙරේ.
210223970	අය කර ගැනීමට සමුච්චිත අරමුදලක් නොමැති නිසා මෙය පැමිණිල්ල විසඳිය නොහැකිය. RM ගෙන් විමසූ විට, ඔහු රක්ෂිතයාට දැන්වූ අතර මෙම නියෝජිතයා මෙම වාරිකය මාර්ගගතව 2024.07.31 පියවා ඇති බවට තහවුරු කළේය. නමුත් ඔහු අපට දන්වා නොමැත. කරුණාකර අමුණා ඇති මෙමෝ බලන්න 2025/10/28 දිනැති RM. මගින් ඉදිප්රිපත් කරන ලද
210223941	රු.91,475 අය කර ගැනීමට ප්‍රමාණවත් අරමුදල් නොමැත.
210223701	මුලින්ම,අප පරීක්ෂණයක් පැවැත් වූ අතර නියෝජිතයා ඉවත් කරන ලදී. නියෝජිතය ඉදිරිපත් කරන ලද අභියාචනය පදනම්ව විමර්ශන අංශය මගින් පැමිණිලි නැවත පරීක්ෂා කෙරේ.

ඉහත දක්වා ඇති එවැනි අවස්ථා සඳහා සේවාදායකයන්ට දැන්වීමට තවදුරටත් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

සියළු රක්ෂණ නියෝජිත පැමිණිලි මාස තුනක් තුළ අවසන් කරන බව සහතික කරමින් සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) පැමිණිලි විසඳීමේ කාලරාමුවට තදින්ම අනුගමනය කළ යුතු බවට සහ ප්‍රමාදයන් වළක්වාලීමට සහ කීර්තිනාමය අවදානම් අවම කිරීමට පැහැදිළි අධීක්ෂණ සහ වගවීම් ක්‍රියාමාර්ග ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කෙරේ.

3.4 අනෙක් සංවිධානවල සම්පත් උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකරණ අදහස් දැක්වීම්	නිර්දේශය
අ. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) හි සේවකයන්ගේ මාසික වැටුප් ගෙවීම් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) ජීවිත අංශයේ කමර්ෂල් බැංකු ගිණුම හරහා සකසමින් පවතින බව නිරීක්ෂණය කරන ලදී.මෙම පරිචය මගින් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) විශේෂ ගිණුමක් හරහා නොව එහි වැටුප් ගණුදෙනු ජීවිත සමාගම සතු ගිණුමක් හරහා සිදු කරන ලදී.තවද, සාමාන්‍ය සේවක වැටුප් අරමුදල ජීවිත සමාගමේ ගිණුමට මාරු කරනු ලැබූ විට පමණක් වැටුප් ගෙවීම් පියවයි.මෙම ක්‍රමය මගින් මෙහෙයුම් සංකීර්ණත්වය වැඩි කළ අතර අරමුදල් ගලා යාම් වල විනිවිදභාවය අඩු කරයි. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) හි රාජකාරී පැවරීම් වල සහ නිවැරදි මූල්‍ය වාර්තාකරණයේ අභියෝගයන් ඇති විය හැකිය. විස්තර පහත දැක්වේ. ගිණුම් විස්තර ගිණුම් අංකය 1480033289 (වාණිජ) ශාඛාව යුනියන් පෙදෙස ශාඛාව ගිණුමේ නම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ජීවිත සමාගම	දනට පවතින HRIS ක්‍රමය එක් වැටුප් සැකසීමේ ක්‍රමයක් යටතේ සංයුක්ත ව්‍යාපාර වලදී වැඩිදියුණු කරන ලදී. ඒ අනුව, ජීවිත ව්‍යාපාර වලට අදාළව ගිණුම සම්බන්ධ කළේය.තවද,නව වැටුප් සැකසීමේ ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කළ අතර 2025 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන පරිදි ජීවිත සහ සාමාන්‍ය ව්‍යාපාරයන් සඳහා වෙනම බැංකු ගිණුම් හරහා වැටුප් මුදල් මාරු කරන ලදී.සංවිධානමය ප්‍රතිවිහුහගත කිරීම සහ නියාමන අවශ්‍යතා අනුව මෙම ක්‍රියාත්මක කිරීම මනා වැටුප් සැකසීම සහ මූල්‍ය කටයුතු වෙන්කිරීම පහසු කරයි.	අරමුදල් පැහදිලිව බෙදා දැක්වීම සහ මූල්‍ය ගණුදෙනු වල විනිවිදභාවය වැඩි කිරීම සහතික කිරීමට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) හි සේවකයන්ගේ වැටුප් සැකසීමට විශේෂිත බැංකු ගිණුමක් සමාගම ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කෙරේ.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම්	නිර්දේශය
අ. 2019/2020 වර්ෂවල අනුමත කළ කාර්යමණ්ඩලය පදනම් කර ගෙන සමාගම මෙහෙයුම් කටයුතු කර ගෙන යන බව නිරීක්ෂණය කරන ලදී.අනුමත කාර්යමණ්ඩලයට පසු සමාලෝචනයන් හෝ යාවත්කාලින කිරීම් නොමැතිවීම මගින් වර්තමාන මෙහෙයුම් අවශ්‍යතාවයන්,සංවිධානමය වර්ධනය හෝ ව්‍යාපාර ප්‍රමුඛතාවයන් වෙනස්වීම ප්‍රමාණවත් ලෙස පෙන්නුම් නොකරයි. මෙය ශ්‍රම බල ආකෘතිය සහ සමාගමේ වර්තමාන සහ අනාගත සම්පත්	මුල් කාලයේදී සමාගම KPMG සමඟ ප්‍රධාන කාර්යාලය සඳහා වැඩ අධ්‍යනයක් කිරීමට සම්බන්ධත විය. කෙසේනමුත්, ලැබුණු මුල් වාර්තාව මූලික වූ අතර තීරණ ගැනීම සඳහා උපකාර වන වැදගත් නිර්දේශයන් එහි අන්තර්ගත නොවීය.එමනිසා, කළමනාකරණය KPMG සමඟ වැඩ අධ්‍යනය අඛණ්ඩව කරගෙන යාම නවතා දැමීමට තීරණය කළේය. වර්තමානයේ මානව සම්පත් දෙපාර්තමේන්තුව අභ්‍යන්තරව	වර්තමාන මෙහෙයුම් අවශ්‍යතාවයන්,ක්‍රමෝපාය පරමාර්ථ සහ පුරෝකථනය කළ අනාගත අවශ්‍යතාවයන් එයින් පෙන්නුම් කරන බවට සහතික වීම සඳහා දැනට තිබෙන කාර්යමණ්ඩල ආකෘතිය පිළිබඳ සමාගම විස්තරාත්මක සමාලෝචනයක් කළ යුතු බවට නිර්දේශ කෙරේ.යම් අවශ්‍ය සංශෝධනයන් විධිමත්ව අනුමත කර සටහන් කළ යුතුය.

අවශ්‍යතා අතර නොගැලපීමකට හේතු විය හැකිය.	අංශවල ආකෘතීන් සංවර්ධනය කිරීම,වර්තමාන ව්‍යාපාර ප්‍රමුඛතාවයන් සහ අනාගත සංවිධානමය අවශ්‍යතා ගැලපීමට සමාගම තුළ විශේෂඥයන් යොදා ගැනීම යන ක්‍රියාවලින් සිදු කර ගෙන යයි. වර්තමාන මෙහෙයුම් සහ ක්‍රමෝපාය නියෝගයන් වලට අනුගත වීම සහතික වීමට අභ්‍යන්තර විශේෂඥතාව භාවිතා කරමින් සංශෝධිත ආංශික ආකෘතීන් සංවර්ධනය කිරීමේ කාර්යයේ මානව සම්පත් දෙපාර්තමේන්තුව නිරත වී සිටී.කටයුතු අවසන් වූ විගස, යෝජිත ආකෘතීන් ක්‍රියාත්මක කිරීමට පෙර HRSC සහ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කෙරේ.2026 ජනවාරි 01 දිනට පෙර එය සම්පූර්ණ කෙරේ.	
ආ. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) හි කළමණාකරුට වත්තල ශාඛාවේ පුළුල් ප්‍රවේශ අයිතියක් සමඟ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) යන ආයතන දෙකෙහිම ක්‍රියාපරිපටීන් වලට ප්‍රවේශවීම තිබූ බව නිරීක්ෂණය කරන ලදී. යෝග්‍ය රාජකාරි බෙදා වෙන් කිරීමක් ක්‍රියාත්මක නොවූ බව මෙයින් පෙන්නුම් කරයි.මීට අමතරව, වත්තල ශාඛාවේ සහකාර කළමණාකරුවන් නොමැතිව ජීවිත දෙපාර්තමේන්තුව යටතේ ශාඛා කළමණාකරු සහ පුහුණු වන දෙදෙනකු පමණක් සේවයේ යෙදෙමින් සැලකිය යුතු කාර්යමණ්ඩල හිගයක් සහිතව ක්‍රියාත්මක වේ.බැංකු ක්‍රියාවලීන්,ශාඛා මෙහෙයුම්,සේවාදායක සන්නිවේදනයන්,ශාඛා වලට යාම් සහ සමහර ඉලක්ක සපුරා ගැනීම සහ කාර්යක්ෂමතාවය සහ පාලන වලට බලපාන සමහර ඉලක්ක සපුරා ගැනීම ඇතුලත් බොහෝ වැදගත් කාර්යයන් වලට ශාඛා කළමණාකරු වග කියයි.	සමාගමේ ශාඛා කළමණාකරු 2024 ජුනි මස පත් කර ඇත.කාර්යමණ්ඩලයේ අඩුකම නිසා, සෙනසුරාදා දින සහ මාසය අවසානයේ සාමාන්‍ය ප්‍රාරක්ෂක ජීවිත අංශයේ කටයුතු වලට සහාය වේ. මීට අමතරව, ඇයට සමාගමේ පද්ධතියට ප්‍රවේශ විය හැකිය.වර්තමානය දක්වා වත්තල ශාඛාවේ කාර්යමණ්ඩල හිගයක් පවතී.නව ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයෙක් බඳවා ගැනීමට HRSC අනුමැතිය ලබා ගන්න ලදී. 2025 නොවැම්බර් මස අවසානයේ එම පුරප්පාඩුව මානව සම්පත් අංශය පුරවනු ලැබේ.	තනි පුද්ගලයෙකුට ඔහු තීරණාත්මක ක්‍රියාවලීන් පිළිබඳ අධික ප්‍රවේශයක් හෝ පාලනයනක් නොමැති බව සහතික කිරීම සඳහා ශාඛා තුළ සංවිධාන සමාලෝචනය සහ රාජකාරී වෙන් කිරීම ශක්තිමත් කිරීම නිර්දේශ කෙරේ.සහකාර කළමනාකරුවන් පත් කිරීම ඇතුළත්ව අතිරේක කාර්යමණ්ඩලය ඵලදායීව වගකීම් බෙදා දීම,මෙහෙයුම් අවදානම අඩු කිරීම සහ සහ සුපරීක්ෂණය වැඩි කිරීමට සලකා බැලිය යුතුය.

3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	කළමනාකරණ අදහස් දැක්වීම්	නිර්දේශය
අ. 2026 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ කරන වාර්ෂික කාලසීමාවන් බලපැවැත්වෙන රක්ෂණ කොන්ත්‍රාත් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 17 මගින් රක්ෂණ කොන්ත්‍රාත් හඳුනා ගැනීම,මැනීම,ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් සඳහා ප්‍රමාණවත් වෙනස්කම් හඳුන්වා දී ඇති අතර විස්තෘත පද්ධතියක්,ක්‍රියාවලිය සහ වාර්තාකරණ යාවත්කාලීන කිරීම් අවශ්‍ය කෙරේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 17 සමාගම තුළ ක්‍රියාත්මක කිරීමට බාහිර උපදේශකවරයෙක්, සමාගම තුළ ආයුගණක කණ්ඩායම,බාහිර ආයුගණකවරුන්,තොරතුරු තාක්ෂණය සහ මූල්‍ය කාර්යමණ්ඩලයක් සම්බන්ධ වේ. සමහර තනතුරු පත්‍රිකා අවසන් කර තිබෙන අතර නව වාර්තාකරණ රාමුවක් සඳහා සංක්‍රමණය වීමේ තීරණාත්මක සන්ධිස්ථාන ක්‍රියාවලිය තවමත් සකසමින් පවතී. ඒකාබද්ධ වීම, පරීක්ෂා කිරීම සහ වලංගුතාවය සඳහා පොරොත්තු කාලයේ වැදගත්කම හේතුවෙන්, මෙම කටයුතු වල ප්‍රමාදයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය අධිකාරීත්වය දී තිබෙන වාර්තාකරණ කාලරාමු වල කටයුතු කිරීමේදී අවදානම් ඇති කරයි.	සියළු අවශ්‍ය උපදේශකවරුන් සේම අවශ්‍ය ගණනය කිරීම් ක්‍රියාත්මක කර ප්‍රසම්පාදනය කර ඇති අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. බහු අංශ කාර්යමණ්ඩලයකින් හඳුනා ගත් පිරිසකට විශේෂ සම්පත් සුළු ප්‍රමාණයක් සමඟ රාජකාරී පවරා දී ඇති අතර අවශ්‍ය පාර්ශවකරුවන් සමඟ මාසික රැස්වීමක් මෙහෙයුම් කමිටුව පවත්වයි.ඉහත මෙහෙයුම් කමිටුවේ සභාපතීත්වය ප්‍රධාන විධායක නිලධාරී (CEO) දරන අතර අදාළ කාර්යයන් සඳහා නියමිත කාල රාමු සකසා ඒවා අනුමත කර පැහැදිළි ව්‍යාපෘති සැලැස්මක් ඇති කරයි.	නිර්වචනය කරන ලද වැදගත් අවස්ථා සහ වගකීම් සමග පැහැදිළි ගමන් පථය,අදාළ කාර්යයන් සඳහා දක්ෂ සම්පත් වෙන් කිරීම මගින් කළමනාකරණය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 17 අධීක්ෂණය වැඩි කල යුතු බවට සහ පද්ධති ප්‍රසම්පාදනය,ඒකාබද්ධවීම සහ පරීක්ෂා කිරීම සම්පූර්ණ කර බලපැවෙත්වන දිනට පෙර වලංගු කරන බවට තහවුරු කළ යුතු බවට නිර්දේශ කෙරේ.

4. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකරණ අදහස් දැක්වීම්	නිර්දේශය
අ.අභ්‍යන්තර විගණන සැලැස්ම -2024 අනුව,අභ්‍යන්තර විගණන අංශය ආයෝජන විගණනයක් කිරීමට සැලසුම් කර ඇත. කළඹ තුළ තිබෙන ආයෝජනයන්හි කාර්යසාධනය,අවදානම සහ සමස්ථ ඵලදායීත්වය ඇගයීම කිරීමට සංවිධානයේ ආයෝජන කළඹ සවිස්තරාත්මකව පරික්ෂා කිරීම සහ තක්සේරු කිරීම ඇතුළත් වන ක්‍රියාවලියක් ආයෝජන විගණනයක් වේ.කෙසේනමුත්, ආයෝජන කටයුතු පිළිබඳව විගණනයක් සිදු කර නොමැත.ආයුගණක ක්‍රියාවලිය විගණනය රක්ෂණ සමාගම විසින් සිදු කරන ආයුගණක කටයුතු වල නිරවද්‍යතාවය,විශ්වාසනීයත්වය සහ යෝග්‍යතාවය තහවුරු කිරීම හා සම්බන්ධ වේ.විගණනය මඟින් රක්ෂකයාගේ මුල්‍ය ස්ථාවරත්වය සහ ඔප්පුහිමියන් ආරක්ෂා කිරීම සහතික කරනු ලබයි.ඒ මඟින් ආයුගණක ක්‍රියාවලිය ඵලදායීව ක්‍රියාත්මක වන බවට සහ අදාළ නියෝගයන් සහ ප්‍රමිත සමඟ අනුගත වීම සහතික කිරීමට සහාය වේ.කෙසේනමුත්, ආයුගණක ක්‍රියාවලිය විගණනය කිරීම අභ්‍යන්තර විගණන සැලැස්ම - 2024 කොටසක් නොවන අතර සමාගමේ ආයුගණක ක්‍රියාවලිය මත අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත.යම් සිදුවීමක් සිදු වීමෙන් විය හැකි තදබල බලපෑමක් හේතුවෙන් එවැනි විගණන සිදු කිරීමට අපොහොසත් වීම ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපර්රේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) කෙරෙහි ඉහළ අවදානමක් ඇති කරයි.	අභ්‍යන්තර විගණන කණ්ඩායම සතුව ආයෝජන විගණනයක් සහ ආයුගණක ක්‍රියාවලිය පිළිබඳ විගණනයක් සිදු කිරීමට අවශ්‍ය කුසලතාවයන් නොමැති අතර වර්තමානයේ අප Q4 2025 ආයෝජන විගණනය ආරම්භ කර තිබේ.අදාළ දත්ත දැනටමත් ලැබී තිබෙන අතර සමාලෝචන ක්‍රියාවලිය දැනට සිදු කරමින් පවතී.	ආයෝජන කටයුතු සහ ආයුගණක ක්‍රියාවලීන් මත අභ්‍යන්තර විගණනයන් කාලීනව සිදු කරන බවට කළමනාකරණය සහතික කල යුතු බවට නිර්දේශ කෙරේ. මෙම විගණනයන් සිදු කිරීමෙන් ආයෝජන කාර්යසාධනය තක්සේරු කිරීම, ආයුගණක නිරවද්‍යතාවය ඇගයීම,නියාමන අනුගතභාවය සහතික කිරීම සහ සමාගමට ඉහළ මෙහෙයුම් සහ මූල්‍ය අවදානම් අවම කිරීමට සහාය වනු ලැබේ.